# දඟකාර අලි පැංචා



J.M. නෙයාෂි අකේෂා හේරත්

කතෘ : J.M. නෙයාෂි අකේෂා හේරත්

චිත්‍ර : J.M. නෙයාෂි අකේෂා හේරත්

දිනය : 2025.02.08

ISBN : 97862420846664

# පිදුම

මහනුවර මහමායා බාලිකා විද්‍යාලයේ
විදුහල්පතිනිය වන ශශිකලා සේනාධීර
මහත්මියටත්,

ප්‍රාථමික අංශය භාර සහකාර විදුහල්පතිනිය
වන සුසිතා අල්විස් මහත්මියටත්,

මට අකුරු කියා දෙන ප්‍රමිතා වෙත්තසිංහ
ගුරුමැණියන්ටත්,

මාගේ දෙමාපිය දෙපලටත්, මෙම පොත
හදපිරි බැතියෙන් පිළිගන්වමි.

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිණුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ ලියන සංස්කෘතියක් ගොඩනගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කර ගැනිමට අප ගත් කතුවරියන් සමත්විම සුවිශේෂි සිදුවිමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යලි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලාද ග්‍රන්ථකරණයට යොමු කරන " හෙරණගත්කරණි" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනය ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි.

**විදුහල්පතිනිය**

**ශෂිකලා සේනාධිර**

**මහමායා බාලිකා විද්‍යාලය**

**මහනුවර**

ISBN : 9786242084664

# දඟකාර අලි පැංචා



එක කැලෑවක අලි පැටියයි, අලි අම්මයි, අලි තාත්තයි ජීවත් වුණා. දවසක් මේගොල්ලෝ ගමනක් ගියා.

ටික දුරක් යද්දි අලි පැටියට හොඳටම වතුර තිබහයි. ඊට පස්සේ අලි පැටියා අලි අම්මට කිව්වා. 'අම්මේ මට හරිම තිබහයි.'



අලි අම්මා ,පොඩ්ඩක් ඉන්න පුතේ, තව ටික දුරකින් වැවක් තිබෙනවා. අපි ඒ කෙන් වතුර බොමු කියලා කිව්වා.





ඔහොම ටික දුරක් යද්දි මේ වැව හම්බුණා. අලි පැටියා වේගයෙන් දුවගෙන ගොස් හොඬෙන් වතුර අරගෙන බිව්වා.

ඊට පස්සේ අලි පැටියා අලි අම්මාගෙන් ඇහුවා 'අම්මේ මම මේ වැවෙන් නාන්නද? ' කියලා අලි අම්මා මේකට කැමති වුණේ නැහැ.





අලි පැටියා, අලි අම්මා කියන දේ ඇහුවේ නෑ. වැවට බැහැලා නාන්න පටන් ගත්තා.

අලි තාත්තා අලි පැටියාටයි අලි අම්මාටයි කෑම ගේන්න ගියා.

ටික වේලාවකින් අලි අම්මා අලි පැටියට ගොඩ එන්න කියලා කතා කළා.





පැටියට ගොඩට එන්න බැහැ. කකුල් වැවේ එරිලා. අලි පැටියා හොඳටම කෑ ගැහුවා.

මේ වෙලාවේ අලි තාත්තා කෑම අරන් ආවා.





ඊට පස්සේ අලි තාත්තයි අම්මයි එකතු වෙලා හොඳෙන් අලි පැටියව ගොඩට ගත්තා.

අලි පැටියා හිතුවා ආය අම්මා කියන දේ අහගෙන දඟ නොකර ඉන්න ඕන කියලා. ඉතින් පුංචි අපිත් දෙමාපියෝ කියන දේ අහලා කීකරුව සිටිමු.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි.

එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදූහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය. මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය.මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දූරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලූ ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි.

මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගලපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

**ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,**

**සෙනෙවිරත්න මහලේකම්**

ISBN : 9786242084664

# ස්තූතියි!

මාව පුංචි කතුවරියක් කළ මහනුවර මහමායා බාලිකා විදුහලේ විදුහල්පතිතුමියටත්, ප්‍රාථමික අංශයේ විදුහල්පතිතුමිය හා පංතිභාර ගුරුතුමිය වන ප්‍රමිතා වෙත්තසිංහ ගුරු මෑණියන්ටත්, අනෙකුත් ගුරු මෑණියන්ටත්, ගුරු පියවරුන්ටත්, ආදරණීය අම්මා, තාත්තා, අයියා ඇතුළු සහය දුන් ඔබ සැමට මාගේ හෘදයාංගම ස්තූතිය පුදකරමි.

